97)

# ශ්‍රී ලංකාවේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ වාණිජ්‍යය හා මුදල් විෂය නිර්දේශයෙහි අඩංගු සංකල්ප සාධනයෙහි ලා සිසුන් තුළ පවත්නා වෙනස්කම් හා එම වෙනස්කම්වල පදනම සෙවීම පිණිස, ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින් කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයක්.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය.

CR

UCLIB
395696

ආර්.පී.කරුණාසේකර.
M.Phil 80/46.
බී.කොම්.
අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට සම්මාන)

1984.11.06.

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA

**<u>සංක්ෂේපයෙන්...</u>**

**<u>පර්යේෂණයේ වැදගත්කම.</u>**

මිනිසා දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ දැනට මත් වාණිජ ලෝකයට අවතීර්ණ වී ඇත. මෙම වාණිජමය ක්‍රියාකාරීත්වයේ බලපෑමෙන් ඈත පිටිසර ගමක ගොවියකුට මෙන්ම, නගරයේ වෙසෙන විද්‍යාඥයකු වද, ඉවත් විය නොහැක. පුද්ගලයකු තාර්කික හා බුද්ධිමත් පාරිභෝගිකයකු වූ විට, ඔහුට වාණිජ ලෝකයට සතුටුදායක ලෙස මුහුණ දිය හැකිය. -තාර්කික හා බුද්ධිමත් පාරිභෝගිකයකු වීමට නම් වාණිජ සංකල්ප මැනවින් සාධනය කරගත යුතුය. එසේ නොවුවහොත් නව වාණිජ–ආර්ථික ලෝකයේදී දැඩි හා කටුක අත්දැකීම් වලට මුහුණු පෑමට සිදුවේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ අවස්ථාවෙන් පසු විශාල පිරිසක් විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහී යන බැව් පෙනේ. මෙම ගිලිහීයන්නවුන් පිරිසද යුහුවම වාණිජ ලෝකයට පිවිසේ.

එබැවින් මෙම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ අවස්ථාවේ දී, වාණිජ විද්‍යා සංකල්ප සාධනය පිළිබඳ අධ්‍යයනයක් කිරීම කාලෝචිතය. එබඳු අධ්‍යයනයක් තුළින්, සිසුන්ගේ සංකල්ප සාධන මට්ටම පිළිබඳවත්, සංකල්ප සාධනය කෙරෙහි බලපාන විචල්‍යයන් පිළිබඳවත්, උසස් සාධන මට්ටමක් ළඟාකර ගැනීම උදෙසා අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් සොයා බැලිය හැක.

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA